# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

මගේ අංකය / எனது இல. / My Ref. CSS/03/01/පොදු-covid19/2020 ඔබේ අංකය / உமது இல / Your Ref. දිනය / திகதி / Date 2021.07.31


ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්,(පාලන/පිරිස්/මුදල්/ඉංජිනේරු සේවා/සැලසුම්)
ලේකම්, (ප්‍රධාන/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර/ක්‍රීඩා) අමාත්‍යාංශය
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්.
දකුණු පළාත.

**<u>රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම .</u>**

උක්ත මැයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක EST-6/03/LEA/3381 හා 2021.07.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(III) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. (එහි පිටපතක් ද මේ සමඟ අමුණා ඇත.)

02. ඒ අනුව, රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යාම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන සෞඛ්‍ය මාර්ගෝපදේශන්ට යටත්ව 2021.08.02 දින සිට සියලුම රාජ්‍ය සේවකයන් සාමාන්‍ය පරිදි රාජකාරි කටයුතු සඳහා වාර්තා කළ යුතුය.

03. තවද ඉහත චක්‍රලේඛයෙහි සඳහන් චක්‍රලේඛ හා චක්‍රලේඛ ලිපි වලට අමතරව, කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය පාලනය පහසු කිරීම සඳහා සීමිත කාර්යය මණ්ඩල චක්‍රීය පදනම මත කැඳවමින් සහ නිවෙස් වල සිට රාජකාරි සිදු කිරීමට අදාළව මවිසින් නිකුත් කරන ලද පහත සඳහන් ලිපිවල සඳහන් විධිවිධානද මෙයින් අවලංගු කරමි.

| අ.අ | දිනය | මගේ අංකය | මාතෘකාව |
|---|---|---|---|
| 01 | 2020.05.11 | CSS/03/01පොදු - Covid -19/2020 | කොවිඩ් 19 වෛරසය පවතින කාලය තුළ දකුණු පළාත් රාජ්‍ය ආයතන විවෘත කිරීම හා සේවා පවත්වා ගෙන යාම |
| 02 | 2020.11.04 හා 2020.11.18 | CSS/03/01පොදු - Covid -19/2020 | ගෝලීය කොරෝනා වෛරස වසංගත තත්ත්වය පවතින අතරතුර දුරස්ථ රාජකාරි කටයුතු ඉටු කිරීමේ වැඩ පිළිවෙල |
| 03 | 2021.04.28 | CSS/03/01පොදු - Covid -19/2020 | රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වා ගෙන යාම |
| 04 | 2021.05.10 | CSS/03/01පොදු - Covid -19/2020 | රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වා ගෙන යාම |

04. රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමේ දී රජයේ නිලධරයන් හා මහජනයාගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සපයනු ලබන සෞඛ්‍ය උපදෙස් තවදුරටත් එලෙසම අනුගමනය කළ යුතු ය. එහිදී විශේෂයෙන් ම පහත සෞඛ්‍ය උපදෙස් පිලිපැදිය යුතු ය.

(අ) දුරස්ථභාවය ආරක්ෂා කිරීම

(ආ) මුව ආවරණ පැළඳීම

(ඇ) දෑත් පිරිසිදු කිරීම

නිසි සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් ආයතනික කාර්යය මණ්ඩලය මෙන්ම සේවාලාභීන් ද කොවිඩ් 19 වෛරසය ආසාදනය වීමෙන් වළක්වා ගනිමින් සේවා සැපයීමේ වගකීම ආයතන ප්‍රධානීන් වෙත පැවරෙන බව ද අවධාරණය කෙරේ.

05. 2021.08.02 දින සිට රජයේ නිලධාරයන්ගේ නිවාඩු සම්බන්ධයෙන් සාමාන්‍ය විධිවිධාන අනුගමනය කළ යුතු ය.

06. යම් රජයේ නිලධරයෙකු පවතින තත්ත්වය තුළ නිරෝධායන රෙගුලාසි යටතේ නිරෝධායනයට යොමු කර ඇත්නම් හා එසේ නිරෝධායනය සඳහා යොමු කර ඇත්තේ රජයේ නිරෝධායන නීති රීති උල්ලංඝනය කිරීමෙන් වන දඬුවමක් ලෙස නොවන්නේ නම් එවැනි නිලධරයන් සඳහා එම නිරෝධායන කාල සීමාව ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 12:9 උප වගන්තියෙහි විධිවිධාන පරිදි සම්පූර්ණ වැටුප් සහිත කාලසීමාවක් ලෙස සැලකිය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතන ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත :- ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස